පොසොන් පෝය එදා සහ අද

ඒ සුන්දර පොසොන් දිනේ
මහින්ද හිමි වැඩිය දිනේ
බුද්ධාගම ලැබුණු දිනේ
ලකටම සෙත සැදුණු දිනේ

බුදු දහමින් පිබිදුණා
ගුණ දහමින් වැඩිවුණා
පස්පව් සැම දුරුවුණා
ලකට ම සෙත සැළසුණා

ටික ටික කල් ගත වුණා
මිනිසුන් තිරිසන් වුණා
පව්කම් තව වැඩි වුණා
ලකදිව හැම පිරි හුණා

දෙදහස් වසරක් ගෙවුණා
අදැහැමියන්ගෙන් පිරුණා
සිරිලක යහමග යවනා
කෙනෙක් එතැයි අපි සිතනා

♦ *විදුරංග මිලෝවන ගුණසේකර*
ආනන්ද විදුහල, කොළඹ



Statue of Liberty නිදහසේ ප්‍රතිමාව

There is a statue of a woman, 46 metres high, and holding a torch in her hand, which stands on Liberty Islands in New York harbour. Designed by the French architect and sculptor Frederic Bartnoldi, famous for his patriotic monuments, it was given to the Americans in 1884 by the French to commemorate the French and American revolutions. Every traveller entering or leaving New York harbour sees the statue which has become a US national monument.

මීටර් 46 ක් උස, ගැහැනියක් දැල්වෙන පන්දමක් අතින් ගෙන සිටින ප්‍රතිමාවක් නිව්යෝර්ක් වරායේ නිදහස් දූපතේ ඉදි කර තිබේ. එය හඳුන්වන්නේ නිදහසේ ප්‍රතිමාව යනුවෙනි. දේශප්‍රේමී පිළි රු අඹන්නට නම් දැරූ ප්‍රංශ මූර්ති ශිල්පියෙකු වන ෆ්‍රෙඩ්රික් බාටොනෝල්ඩ් ගේ දැතින් නිමැවූ එය 1884 දී ඇමරිකාවට දෙන ලද්දේ ප්‍රංශය විසින් ප්‍රංශ-ඇමරිකානු විප්ලවයන් සිහිවීම පිණිසය. නිව්යෝර්ක් වරායට ඇතුල්වන පිටවන සෑම සංචාරකයෙකුටම දැන් ඇමරිකානු ජාතික සිහිවටනයක් ලෙස සැළකෙන මෙම දැවැන්ත නිදහසේ කාන්තා ප්‍රතිමාව නිසැකවම දෙනෙතට හසුවන්නේ ය.

♦ *Auntie Ramani (රමණි නැන්දා)*

ශ්‍රීලංකාව නම් මගේ රට

වටේ මහ මුහුදයි
සීතල සුළං විහිදයි
දකින අය පුබුදයි
දිව්‍ය ලෝකය මීට පරදයි

මල් පිපෙන පොකුණු ද
කඳු ගං කැලෑ කුඹුරු ද
වතුපිටි මිණි මුතු ද
තිබේ මගෙ රට
කාට දෙවෙනි ද

ගැමුණු රජ්ජුරු වෝ
තොටගමු හාමුදුරු වෝ
තවත් රජ දරු වෝ
මගේ පොඩි රට
දියුණු කෙරු වෝ

♦ *රන්දික මෙත්රුවන්*
නාරංගස්තැන්න ප්‍රා.වි.
ගලපිටමඩ Sri Lanka



හිතෝපදේශය නොකී කවි

කර්තා - චන්ද්‍රසිරි දොඩන්ගොඩ



මා මෙන්ම බහුතර සිංහළ පාඨක ලෝකය චන්ද්‍රසිරි දොඩන්ගොඩ හඳුනන්නේ දිවයින කර්තෘ මණ්ඩලයට සම්බන්ධ ප්‍රවීන මාධ්‍ය වේදියෙකු හා ලේඛකයෙකු වශයෙනි. ඔහුගේ හරබර ලිපි එහි විශේෂාංග පිටුවල නිරතුරු පළවී තිබෙනු දක්නට ලැබෙයි. ඉතා නුදුරු කලකට පෙර යුද්ධය බැරෑරුම්ව සිදුවූ ඒ වකවානුවේ ඔහුගේ ලිපි හා විශේෂාංග අප සේනාංකයන්ටද, රටේ ජනතාවටද ධෛර්‍ය්‍ය ද, නොසැලී අකම්පිතව සිටීම වඩවන්නට අනුබලද දුන් අයුරු අපි වටහාගත්තෙමු. එසේම ඔහුගේ ඒ ලියවිලි වල කිසියම් කාව්‍යමය ගතියක් මිශ්‍රව ඇති බවක්ද හැඟුණි. ඉඳ හිට **දිවයින** පුවත්පතෙහි ඔහුගේ පැදි පෙළක් පළවී තිබෙනු දක්නට ලැබෙයි. කලාතුරකින් වුවද ඔහු ඒ ලියන කවි අපට හමුවන වෙනත් කාව්‍ය රචනාවන්හි නොදක්නා නැවුම් සොඳුරුබවක් දැනවිය.

ශ්‍රීලංකාවේ සිට පැමිණි මගේ හිතවතෙකු මට ගෙනැවිත් දුන් පොත් කීපයක් අතර දොඩන්ගේ කාව්‍ය සංග්‍රහයක්ද විය. එය පළවී ඇත්තේ දැනට දෙවසරකට පෙර වුවද මා ඒ කවිපොත ගැන දැනගත්තේ එදා ඒ මට ලැබුණු අවස්ථාවේ දී ය. එයට නම තබා ඇත්තේ " හිතෝපදේශය නොකී කවි " යනුවෙනි. ඒ නම කාව්‍ය සංග්‍රහයට මනාව ගැලපෙන බව කවි එකින් එක කියවාගෙන යද්දී මට පසක් විය. ඒ හැම කවිය කම අපූර්වත්වයක් වෙයි.

හිතෝපදේශය යනු භාරතයේ බොහෝ කලකට පෙර (12 වන සියවසේ) රචනාවුණු ගද්‍ය හා පද්‍ය සංකලනයකින් යුක්ත උපදේශ සංග්‍රහයකි. එහි විසූ ධවලචන්ද්‍ර නම් රජු තම කුඩා පුත්‍රයාට රාජ්‍ය කරණයෙහි උපායාංගත්, ගරුකටයුතු බුද්ධිමත් ජීවිතයක් සකසා ගන්නා උපදේශත් කියාදෙන ක්‍රමයක් එවක විසූ කීර්තිමත් නාරායන නම් පඬිවරයාගෙන් විමසා සිටියේය. නාරායන පඬිවරයා ඒ වෙනුවෙන් සම්පාදනය කළේ **හිතෝපදේශ කථා සංග්‍රහය**යි. එය කුඩා කතාන්තර ඇසුරෙන් යහපත් ධර්මතා හිතට කා වදින ලෙස උපමා සහිතව විස්තරකරයි. **හිතෝපදේශ ග්‍රන්ථය** අද ලොව භාෂා ගණනකට පෙරළී ඇත. සිංහළ **සුභාෂිත කාව්‍ය**ද එහි ආභාෂය ලැබුවක් බව පෙනේ.

එහෙත් දොඩන්ගොඩගේ මේ පද්‍ය සංග්‍රහයෙහි හිතෝපදේශ යෙන් ගත් කිසිවක් නැත. ඒවා හිතෝපදේශය නොකී කවියයි ඔහු කියයි. එය ඇත්තය. මේ කවි ඔහුගේ නිර්මාණ ශක්තිය තුළ බිහිවූ සරළ මිහිරි කල්පනාවන්ය.

දොඩන්ගේ මේ කවි මිනිස් ජීවිතය හා බැඳුණු ප්‍රීති සුඛ වේදනාවන්ට නව අර්ථ කථන සපයන බවක් දක්නා ලැබේ. ඒ අර්ථකථන මින් පෙර මා කියවූ වෙනත් කවියක එතරම් පැහැදිලි ලෙස තිබුණු බවක් මට නොහැ-ඟේ ඒවා ඔහුගේම නිවහල් කල්පනාවන්හි ප්‍රථිපල වෙති. එසේම ඒ අදහස් අප කාටත් පොදු ධර්මතා ඇසුරු කරගෙන ඇති නිසා එයින් විශ්වසනීය ගතිය වඩාත් උද්දීපනය වෙයි.

සැබෑ කවිත්වය පරිණතබව තුළින් ලියලා වැඩෙන්නකි. එය එක රැයින් කෙනෙකු වෙත එන දෙයක් නොවේ. උගත්දේ අවට දක්නා දේ සමාජ ආශ්‍රයෙන් උකහාගන්නා දේ මේ ආදි සියල්ල කතා රචකයෙකුට මෙන්ම කවියෙකුට ද තම නිර්මාණයන් බිහිකරන්නට අවශ්‍ය අමුද්‍රව්‍යයෝ වෙති. ඊළඟට, ස්වභාවයෙන් එන ප්‍රතිභාව ඔහු සිතට එන අදහස් මනරම් කවියක් බවට හරවයි.

හිතෝපදේශය නොකී කවි සංග්‍රහයේ දොඩන්ගොඩ කවියා තෝරාගෙන ඇති මාතෘකා සියල්ල අප දකින අප ඇසුරු කරන අප හා නිරන් තරයෙන් ගැටෙන දේවල්ය. එහෙත් ඒ හැම දෙයක් දෙස හැඟීමෙන් බර නොවී කලා කරුවෙකු සතු ඉවසීම සහ උපේක්ෂාවෙන් බැලීමේ අගනා පුරුද්ද මෙහි හැම කවකම ගැබ්වී ඇති බව වැටහේ.

දහසක් කවීන් අතුරෙන් මගේ සිත්ගත් කවීන් සිටින්නේ ස්වල්ප දෙනෙකි. චන්ද්‍රසිරි දොඩන්ගොඩ ද ඒ අතර සිටියි.

විදේශයේ වෙසෙන අපට සිංහළ කාව්‍ය සංග්‍රහයක් කියවන්නට ලැබෙන්නේ කලා තුරකිනි. ඒ කලාතුරකින් ලැබෙන දේ වුවද අගයකරන් නට කාව්‍ය ලැදි අතලොස්සක් හෝ සිටිනවාය යන්න මට හැඟී ගොස් බොහෝ කලකි. ඉදහිට හෝ මේ කුඩා පුවත් පතේ කවිපොතක් පිළිබඳ කිසියම් අගැයුමක් අප පළකරන්නේ ඒ රසික පිරිස සිත්හි තබාගෙනය.

මේ කාව්‍ය සංග්‍රහයේ එන පද්‍ය පංති 25 ක් අතුරින් එකකින් එක කවියක් පමණක් ගෙන මෙහි දක්වමි. ඒවා කිය වන ඔබට කවියා පමණක් නොව ඔහු තුළ සිටින දාර්ශ-නිකයා ද දැකිය හැකි ය. **හිතෝපදේශය නොකී කවි** සංග්‍රහය කාව්‍යලෝලී පාඨක සිත්හි නිරතුරුවම රැඳී සිටින බව නිසැකය.

♦ *දයා ආනන්ද*

ඉපැරණි ගසක් සැතකින් වෙන් කළ සැනිනී
ඒ ගස වැටෙන විට හැඬුවේ මුල පමණි
සෝ දුක් දරාගෙන ගිලිහෙන නෙත් අගිනී
කඳුලක වෙහෙස දන්නේ කම්මුල පමණි

බිඳුණු පෙමට නාඩා ඉන්නද කොහොම
රිදුණු සිතය දන්නේ කැළලෙහි තරම
දිනෙක නවමු පෙමකට ලද කල වරම
බිඳුණු පෙමද පාඩම් පොතකිය කදිම

පුරා දිනක් වැහි වැස්සද එක පැහැර
බිඳී නොයයි සියුමැලි දළුවක නහර
ඉතා දැඩිවූ අයෙකුගෙ රළු අත් අතර
කුඩා බිළිඳු නැලවෙනු වැනි ඇස් නොහැර

ඉතා වෙහෙස වී පැල කොට තබා වැට
සැදූ ගහේ ගෙඩි රතුපැහැ ගැනෙන විට
කෙසේ හෝ ඇවිත් සියොතුන් තබති හොට
ලොවේ මෙවැනි අවනඩු ඇත බොහෝ කොට

කොපමණ මිහිරි වුව පෙම් කුසුම සුනිමල
අපමණ දුක් ගෙනේ පරවී වැටුණු කල
මියගිය පෙමට තම ජීවිතය පුද කළ
කෙනෙකුට නිගා මම නම් නොදෙමි කිසි කල

නොමඳ සොම් ගුණැති සඳරැස් වැටුණු සැන
හැකිළ තිබූ කුමුදු සුපිපෙයි අසුරු සැන
පෙමැති බැලුමකින් ළඳකගෙ ඇසින් දෙන
මියෙන මිනිසෙකුට වුව යළි ලැබෙයි පණ

උදය ගිරින් දිවි ගෙවුමට පිටත් වුන
අතට වෙරළු බරටම දර හිසින් ගෙන
ගෙදර එන මවුන් දැක පුතු මුවින් එන
මිහිරි සිනාවට ලොව කොහි නමක් වෙන

විලස දෙවිදතුන් බඳු මැරකම් වලට
රුදුරු මිනීමරු පුත් වෙත හැම කලට
එබඳු පුතෙකු මරබිය ළං වූ කලට
දුවති තමන්ගේ මවගේ දොරකඩට

දොරට ගසා අම්මේ යයි කී කලට
සැනින දොර අරියි උණු වී දරු පෙමට
එබඳු මිනීමරු පුතු වුව බැරි කලට
ළඟට ගැනුම අම්මා කෙනෙකුගෙ සිරිත

වෙතොත් මෙලොව සැමියෙක් බිරිඳකත් ඇත
නැතක් පහර දෙත් ඔහු ඒ බිරිඳ වෙත
නමුත් ඔත්පලව වැටුණොත් ඇඳක් වෙත
වෙතොත් සරණ බිරිඳය වෙන ළඳක් නැත

ගසෙක මලක් පිපුණිද ලොව සරසත්ද
අසුරු සැනින් ඒ මල බිම ගිලිහෙත්ද
එමල සෙනේ පැතූ යම් බඹරෙකු වෙත්ද
කෙබඳු සොවක් ඔහු හද තුළ ඇති වෙත්ද?